# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244. Katugasthota Road. Kandy.

web site: *www.psc.cp.gov.lk*

e-mail: psc.cp.gov@gmail.com

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary: 081-2213096 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082 |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/8/3/27/2022 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date 2022.03. 09 |

මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි/ සංවර්ධන නිලධාරි සේවාවල නිලධාරින් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2022**

පහත සඳහන් සේවාවන්ට අදාළ 2022 වසරේ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධව යෝජිත ස්ථාන මාරු නියෝග නිකුත් කළ මගේ සමාංක හා 2022.02.11 දිනැති ලිපිය හා බැඳේ.

- මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය
- මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවය

02. ඉහත සේවාවන්ට අදාළ අභියාචනා තීරණද ඇතුළත් 2022 වර්ෂයේ අවසන් වාර්ෂික ස්ථාන මාරු නියෝග ලේඛණය අපගේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇත.

03. ඒ අනුව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කළ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GCP/04/01/03 සහ 2022.01.19 දිනැති ලිපියේ සඳහන් නියෝගය පරිදි, **මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි/ සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින්ගේ 2022 වර්ෂයේ අවසන් වාර්ෂික ස්ථාන මාරු නියෝග 2022.03.15 දින සිට නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාත්මක කළ යුතු බව කාරුණිකව දන්වමි.**

04. තවද පහත කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් අනුප්‍රාප්තිකයන් ලබාදී නොමැති නම්, පත්වීම් ලද නව සංවර්ධන නිලධාරින් අනුප්‍රාප්තිකයන් ලෙස සලකා ස්ථාන මාරු නියෝග ලද නිලධාරින් මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,

II. මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් අනුප්‍රාප්තිකයන් ලබාදී නොමැති සේවා ස්ථාන සඳහා ඉදිරියේදී නව කළමනාකරණ සේවා නිලධාරින් ලබාදීමට නියමිත බැවින් එම නිලධාරින් අනුප්‍රාප්තිකයන් ලෙස සලකා ස්ථාන මාරු නියෝග ලද නිලධාරින් මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,

III. සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු නියෝග දීර්ඝ කර ඇති නිලධාරින් සඳහා සුදුසු නිලධාරින් කඩිනමින් පුහුණු කර නියමිත දිනයේදී මුදාහැරීමට කටයුතු කරන ලෙසත්,

IV. 2022 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලේඛණයන් හි නම් සඳහන් නොවන, 2019 සහ 2020 වර්ෂයන් හි ස්ථාන මාරු නියෝග ලබා මේ දක්වා මුදාහැර නොමැති නිලධාරින් සිටින්නේ නම්, එම නිලධාරින් වහාම නව සේවා ස්ථාන වෙත මුදාහරින මෙන් කාරුණිකව සඳහන් කරන අතර එම ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් නැවත සලකා නොබැලීමටත්, එම ස්ථාන මාරු නියෝගයන් ක්‍රියාත්මක කළ දින සිට අදාළ නිලධාරින් ස්ථාන මාරු කර ඇති සේවා ස්ථානයන් වෙත වාර්තා කර ඇති බවට සළකා ඉදිරි කටයුතු සිදු කිරීමටත්, කොමිෂන් සභාවේ උක්ත නියෝගයන් ක්‍රියාත්මක කර නොමැති නිලධාරින් හා ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා එම නිලධාරින්/ ආයතන ප්‍රධානීන් වෙතින් නිදහසට කරුණු විමසීමටත් ගරු කොමිෂන් සභාව තීරණය කර ඇති බවත්,

V. ඒ අනුව 2022 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලේඛණයන් හි නම් සඳහන් නොවන, 2019 සහ 2020 වර්ෂයන් හි ස්ථාන මාරු නියෝග ලබා මේ දක්වා මුදාහැර නොමැති නිලධාරීන් වහාම මුදාහැර එම නිලධාරීන්ගේ තොරතුරු කඩිනමින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා එවීමට කටයුතු කරන් ලෙසත් කාරුණිකව දන්වමි.

05. 2022 වාර්ෂික ස්ථාන මාරු මාර්ගගත ක්‍රමයට **(Online)** තොරතුරු කැඳවීමේදී සම්බන්ධිකරණය සඳහා ඔබ විසින් පත් කරන ලද විෂය භාර නිලධරයා විසින්, **2022** වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඔබ ආයතන වෙත සේවයට වාර්තා කර ඇති නිලධාරීන්ගේ තොරතුරු පහත සඳහන් උපදෙස් අනුගමනය කර සම්පූර්ණ කළ යුතුවේ .

I. මුලින්ම ඔබගේ ආයතනයේ gmail නිල විද්‍යුත් තැපැල වෙත පිවිසෙන්න.

II. වාර්ෂික ස්ථාන මාරු සඳහා පමණක් භාවිත අපගේ විද්‍යුත් තැපැල් ලිපිනය trans.psc.cp.gov@gmail.com මගින් ඔබ ආයතනයේ විද්‍යුත් තැපැල වෙත එවූ පහත සඳහන් **google spreadsheet** වෙත පිවිසෙන්න.

- 2022 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් කළමනාකරන සේවා නිලධාරීන් (MSO) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය

- 2022 වාර්ෂික ස්ථාන මාරු - මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරීන් (DO) සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු ලේඛනය

III. එහි තොරතුරු ඇතුළත් කිරීමේදී Unicode (Iskoola potha) අකුරු වර්ගය භාවිතා කළ යුතුය.

IV. ඉහත google spreadsheet හි ඇති සේවයට වාර්තා කිරීම පිළිබඳ තොරතුරු හි ඔබගේ ආයතනයට පමණක් අදාළ ස්ථානයක් වෙන් කර ඇති අතර එහි අවසන් තීරු (column) 2 හි පමණක් අදාළ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න.

V. එම විස්තර ඇතුළත් google spreadsheet හි ඔබ ආයතනයට අදාළ කොටසෙහි වාර්තාව පමණක් මුද්‍රණයකර (Print out) ආයතන ප්‍රධානියාගේ අත්සන සහිතව **2022.04.08** ට පෙර තැපැල් මඟින් **මෙම කොමිෂන් සභාව වෙත එවිය යුතුය.**

මෙම කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.ජේ.ඩී.ඩබ්. දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.

පිටපත් :
1. විගණකාධිපති - අ.ක.ස.
2. සම්බන්ධිකරණය සඳහා පත් කළ විෂය භාර නිලධරයන් වෙත - ඉහත උපදෙස් අනුගමනය කර තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා